මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல்கள் ஆணைக்குழு

පොදු කාර්යාලය : 011-2868441, 2868442, 286844
பொது அலுவலகம்
ෆැක්ස්/தொலைநகல் : 011-2868426

මැතිවරණ කොමිෂන් සභා කාර්යාලය
සරණ මාවත,රාජගිරිය (10107)
தேர்தல்கள் ஆணைக்குழு அலுவலகம்
சரண மாவத்தை, இராஜகிரிய (10107)

web : www.slelections.gov.lk e-mail : info@slelections.gov.lk

| | | |
|---|---|---|
| මගේ අංකය : EC/EDR/LAE/2023/04B<br>எனது இல. | ඔබේ අංකය :<br>உமது இல. | දිනය : 2023.02. 10<br>திகதி |

**චක්‍රලේඛ අංක 53**

සියළුම නගරාධිපතිවරු සහ සභාපතිවරු වෙත

**පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2023.03.09**

**පළාත් පාලන ආයතන සතු රාජ්‍ය දේපළ අයුතු පරිහරණය වැළැක්වීම.**

**01. පළාත් පාලන ආයතන ප්‍රධානීන්ගේ නිල වාහන:**

1.1 පළාත් පාලන ආයතන ප්‍රධානීන්ගේ රාජකාරි කටයුතු ඉටුකිරීම, පහසුවීම සඳහා ඔවුනට ලබා දී ඇති වෙන්කළ නිල වාහනය, "ඔවුන්ගේ පෞද්ගලික පාවිච්චියට ද හිමිකම තිබේ" යන කරුණ උපයෝගී කරගනිමින් ස්වකීය නිල වාහන භාවිතා කරමින් දේශපාලන ක්‍රියාකාරකම්වල නිරත වන බවට විශේෂයෙන්ම ස්වකීය පළාත් පාලන බල ප්‍රදේශයේ හා ඉන් බැහැර පිහිටි දේශපාලන රැස්වීම්වලට සහභාගී වන බව හා ප්‍රචාරක කටයුතු සඳහා මෙන්ම පෝස්ටර්, අත්පත්‍රිකා ප්‍රවාහනය සඳහා යොදා ගන්නා බව වාර්තා වී තිබේ.

1.2 පළාත් පාලන ආයතන ප්‍රධානීන්ට වෙන් කළ නිල වාහන දේශපාලනමය ප්‍රවර්ධන කටයුතු සඳහා හෝ දේශපාලන ප්‍රචාරක රැස්වීම් සඳහා යෑම්-ඊම් පිණිස භාවිතා කිරීම තහනම් බව මෙයින් නැවතත් අවධාරණය කරනු ලැබේ.

1.3 යම් පළාත් පාලන ආයතන ප්‍රධානියකු, ස්වකීය නිල වාහනය භාවිතා කරමින් දේශපාලන රැස්වීම්වලට සහභාගීවීම හෝ දේශපාලනමය කටයුතුවලට නිල වාහනය යොදා ගැනීම රාජ්‍ය දේපල අවභාවිතා කිරීමක් සේ සලකනු ලබන බව ද වැඩිදුරටත් දන්වා සිටිනු ලැබේ.

**02. පළාත් පාලන ආයතන සතු වාහන හා වෙනත් උපකරණ බඩුබාහිරාදිය සහ කාර්ය මණ්ඩලය දේශපාලන කටයුතු සඳහා යොදා ගැනීම:**

2.1 පළාත් පාලන ආයතන සතු සංචිත වාහන (හෝ වෙන්කළ නිල වාහන) පක්ෂ/අපේක්ෂක ප්‍රවර්ධනය පිණිස පෝස්ටර් ප්‍රවාහනය, රැස්වීම් සංවිධානය හා ඒ සඳහා බඩුබාහිරාදිය ප්‍රවාහනයට යොදා ගැනීම් වාර්තා වී ඇති අතර, මෙවැනි අනීතික ක්‍රියා සිදුකරන ලද අවස්ථාවල අදාළ වාහන/උපකරණ පොලිස් අත්අඩංගුවට ගෙන නඩු පැවරීම් සිදුකරන ලෙසට පොලිසියට උපදෙස් දීමට ක්‍රියාකරනු ලැබේ. එහෙයින් මේ කිසිදු සංචිත හෝ නිල වාහනයක් පක්ෂ/අපේක්ෂක ප්‍රවර්ධනය සඳහා යොදා ගැනීමෙන් වැලකී සිටීමේ අවශ්‍යතාව නැවතත් අවධාරණය කරනු ලැබේ.

2.2 පළාත් පාලන ආයතන සතු කොඩි කණු, වේදිකා සැරසිලි යනාදිය ඇතුළු රාජ්‍ය දේපල කිසිවක් අනීතික ලෙස දේශපාලනමය ප්‍රවර්ධනය කටයුතු සඳහා යොදා ගත නොහැක. එසේ වුව ද, පක්ෂ/අපේක්ෂක භේදයකින් තොරව කොඩි කණු, වේදිකා සැරසිලි, ක්‍රීඩා භූමි රැස්වීම් ශාලා යනාදිය නියමිත ගාස්තු අයකිරීමෙන් දේශපාලන පක්ෂ/අපේක්ෂකයන් හට කුලියට ලබාදීමට බාධාවක් නැත.

2.3 පළාත් පාලන ආයතන ප්‍රධානීන්ගේ නිල නිවාස, දේශපාලන පක්ෂ/අපේක්ෂක ප්‍රවර්ධනයට ජනතා රැස්වීම් සඳහා හෝ මාධ්‍ය සාකච්ඡා සඳහා යොදාගත නොහැකි ය. තවද, මෙවැනි නිල නිවාස, පක්ෂයක/අපේක්ෂකයකුගේ ප්‍රවර්ධනය සඳහා වූ ජාතික හෝ දිස්ත්‍රික් හෝ ප්‍රාදේශීය හෝ ඡන්ද කාර්යාල ලෙස හෝ ඡන්ද හිමියන් කැඳවා පවත්වන ප්‍රචාරක රැස්වීම් හෝ පක්ෂ/ අපේක්ෂක මාධ්‍ය සාකච්ඡා සඳහා යොදා නොගත යුතු ය. තවද ඡන්ද විමසීම් නීතියේ සඳහන් කිසිදු වරදක් හෝ දූෂණ ක්‍රියාවක් හෝ නීති විරෝධී ක්‍රියාවක් හෝ රජයේ නිල නිවාස තුළ හෝ නිල නිවාස පරිශ්‍රයේ නොකළ යුතු ය.

නිලධාරීන් විසින් යොදවන බවට සමහර කාර්ය මණ්ඩල සාමාජිකයන් වෙතින්ම පැමිණිලි ලැබී තිබේ. මෙය ඉතා බරපතල වරදකි. මෙම කාර්යයන්ගෙන් වැළකී සිටින ලෙස හා එවැනි අකටයුතු සඳහා කිසිවෙකුට ඉඩ නොදෙන ලෙස සියලුම පළාත් පාලන ආයතන ප්‍රධානීන් හා ඒවායේ පරිපාලනය භාර නිලධාරීන් වෙත තරයේම දන්වා සිටිනු ලැබේ.

**03.** **දේශපාලන පක්ෂ/අපේක්ෂක රැස්වීම්, ප්‍රචාරක පෝස්ටර්, පා ගමන්, අත් පත්‍රිකා බෙදීම් යනාදියට අදාළ නීති උල්ලංඝනය කිරීමෙන් වැළකී සිටීමේ අවශ්‍යතාව.**

3.1 පක්ෂ/අපේක්ෂක ප්‍රවර්ධනය දැන්වීම් පුවරු, බැනර්, ධජ පතාක යනාදිය ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කිරීමේ වරදෙන් හා පාගමන්, පාපැදි/යතුරු පැදි/රථවාහන පෙළපාලි පැවැත්වීමේ වරදෙන් වැළකී සිටින ලෙස හා ස්වකීය සහායකින් එම වරද කිරීමෙන් වළක්වා ගන්නා ලෙස සියලුම පළාත් පාලන ආයතන ප්‍රධානීන් වෙත දන්වා සිටිනු ලැබේ.

3.2 එසේම සංග්‍රහ කිරීමේ වරද, අයුතු බලපෑමේ වරද, යනාදි පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් පනතේ සඳහන් වැරදි/නීති විරෝධී ක්‍රියා කිසිවක් සිදු නොකිරීමේ අවශ්‍යතාව හා ස්වකීය සහායකයන් ද එම අනීතික ක්‍රියා කිරීමෙන් වලක්වා ගැනීමේ අවශ්‍යතාව සියලුම පළාත් පාලන ප්‍රධානීන් වෙත අවධාරණය කරනු ලැබේ.

**04.** පෙර සඳහන් ආකාරයේ කරුණු සම්බන්ධයෙන් පැමිණිලි ලැබී එය සනාථ වුවහොත් එම ක්‍රියා මැතිවරණ කොමිෂන් සභාවේ විධාන කඩකිරීමක් ලෙස සලකා අදාළ පළාත් පාලන ආයතන ප්‍රධානීන්ට හා ඒවායේ පරිපාලනය භාර නිලධාරීන්ට එරෙහිව ක්‍රියා කිරීමට මැතිවරණ කොමිෂන් සභාව පියවර ගන්නා බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

**05.** මෙවැනි අකටයුතු පිළිබඳව පැමිණිලි ඉදිරිපත් කරන ලෙස සියලුම පුරවැසියන්ගෙන්, සිවිල් සංවිධාන හා මාධ්‍ය ආයතන වෙත දන්වා ඇති අතර මෙවැනි අනීතික ක්‍රියා පිළිබඳව තදින් හා ක්ෂණිකව ක්‍රියා කරන ලෙස පොලිස් නිලධාරීන් වෙත උපදෙස් දී තිබේ.

**06.** නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්විය හැක්කේ සියලුම පුරවැසියන්, රජයේ නිලධාරීන් හා දේශපාලනඥයින් ඡන්ද විමසීම්වලට අදාළ නීති හා විධාන, උපමාන හා ආචාර ධර්මවලට අනුකූලව ක්‍රියා කළහොත් පමණක් හෙයින් මේ සම්බන්ධයෙන් පළාත් පාලන ආයතන ප්‍රධානීන්ගේ නිසි අවධානය යොමු කරවීමට නාගරික කොමසාරිස්වරු/ නාගරික ලේකම්වරු සහ නගර සභා / ප්‍රාදේශීය සභා ලේකම්වරු ක්‍රියා කළ යුතු ය.

**07** තවද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 ආ (4) (අ) ව්‍යවස්ථාව අනුව මැතිවරණ කොමිෂන් සභාව නිකුත් කරන ලද අංක 2313/32 දරන 2023.01.04 දිනැති විධාන පිළිබඳ අති විශේෂ ගැසට් නිවේදනය හා අංක 2313/31 දරන 2023.01.04 දිනැති ආචාර ධර්ම පිළිබඳ අති විශේෂ ගැසට් නිවේදනය කෙරෙහි අවධානය යොමු කරවනු කැමැත්තෙමි.

නිමල් ජී. පුංචිහේවා
සභාපති
මැතිවරණ කොමිෂන් සභාව

පිටපත්:

01. සියළුම භාරකාර නිලධාරීන්
02. දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරු
03. සියළුම නාගරික කොමසාරිස්වරු
04. සියළුම සභා ලේකම්වරු

} දැනගැනීම සහ අවශ්‍ය කටයුතු සඳහා

සභාපති
තවිසාළා
දුරකථන/தொலைபேசி : 011-2868444
ෆැක්ස්/ தொலைநகல் : 011-2868445
e-mail : chairman@elections.gov.lk

මැතිවරණ කොමසාරිස් ජනරාල්
தேர்தல்கள் ஆணையாளர் நாயகம்
දුරකථන/தொலைபேசி : 0112885207
ෆැක්ස්/தொலைநகல் : 0112885208
e-mail : cge@elections.gov.lk
dgelection@elections.gov.lk

අතිරේක මැතිවරණ කොමසාරිස් (නීති හා විමර්ශන)
மேலதிக தேர்தல்கள் ஆணையாளர் (சட்டம் மற்றும் விசாரணைகள்)
දුරකථන/தொலைபேசி: 011-2867471
ෆැක්ස්/தொலைநகல்/Fax : 011-2868448